කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

මානවශාස්ත්‍ර පීඨය

# සිංහල

සිංහල ගද්‍ය සාහිත්‍යය නාට්‍ය හා සිනමාව- **SINH 28214**

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින්වත් තෝරාගෙන
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

## 1 කොටස

01. පහත සඳහන් ඡේදවල අදහස ලිහිල් බසින් ලියා කතුවරයා සතු අවස්ථා නිරූපණ කුසලතාව පිළිබඳ කෙටි ඇගයීමක් කරන්න.

අ. අප යවු දූනුවායෝ හයාගත් හීදඬු හැරැපියැ නො හී සිතියමැ ඇන්දා සේ සිටැ ඔවුන්ගේ බණ අසා අමාමහනිවන් දුටිහැ. අපත් නුඹත් කළ යත්නයෙන් තුබූයෙක් කිම් ද? ඉනිබ්බ කීවක් කරම්හ'' යි කී කලැ'' මහරජ, එසේ නො වෙයි. ඒ ශ්‍රමණ ගෞතමයෝ දුටුදුටුවන් ඇස් නිවාපියැ හෙන, විඳිවිඳියන් සිත් පිණවාපියැ හෙන රූපයක් ඇත්තාහැ. එහෙයින් ඇස් ඇති මිනිසෙක් ඔවුන්ගේ රුව බලබලා උන්ට ද්‍රොහයක් කට නොහෙයි. තොපගේ නාලාගිරි නම් මතැත් බුදුගුණ නො දන්නි. බුදුරුවෙහි රස නො දන්නි. දැන් මද හී සිටියේ. ඔහු උන් සිඟා වඩනා මඟැ මෙහෙයා මරවා ගණුම්හැ''යි රජ්ජුරුවන් ගිවිස්වා ඇත්ගොව්වන්ට සම්මත කරවා ඔවුන් අත අල්වා ගෙණැ රජගෙන් පිටත් වැ ''අප සිතැ ඇත්ත සාධා දුන් කලැ, තොප සිතැ ඇත්තක් සාධා දෙන්නට අප පොහොසත් බව දන්නවු ද? සෙට ශ්‍රමණගෞතමයන් මැරුව හොත්, රජ්ජුරුවන්ගේ සේසත තබා ඉතිරි කැමැතියක් ඉල්වා දෙම්හැ. පෙරැ ඇතු බොන රා අට කළයක් දැන් දියුණු සොළොස්කළයක් පොවා මත් කොට කොහොලින් ඇතැ කුප්පා බුදුන් සිඟා වඩනා මඟැ මෙහෙයා උන් මරවා අපගේ මනෝරථය සිද්ධ කරව''යි ගිවිස්වූහැ.

ආ. බෝසතානන් වහන්සේ වදාළ කාරණය අසා රජ්ජුරුවෝ, ''කිමෙක් ද, සේනකයෙනි'' කීහ. ''ඇසුව මැනැවැ, දේවයන් වහන්සැ'' යි ගාථායෙකින් කාරණය දක්වනු පිණිස, ''කායාදි සංයමයක් නැති වත් යමෙක් පරිවාර සම්පත් ඇත්තේ වී නම්, එබඳු ඉසුරුමත් පුරුෂ තෙම්, මහ පිරිස පිරිවරා අධිකරණයෙහි හිඳ, අනුනට මෙ ලොවින් පර ලොවින් වැඩක් වන කාරණයක් වත් අවැඩක් වන කාරණයක් වත් කියන්නේ වී නම්, තේජස් වී හෙයින් සභා මධ්‍යයෙහි ඔහු ගේ බස ම නැගෙන්නේ ය. ඉසුරුමත් තැනැත්තේ හිමින් නොහිමි කිරීම් ආදී වූ අවැඩට සුදුසු  බසකුදු කියන්නේ වී නම්, සභාවට ඇදැහිය යුතු බව ශ්‍රී කාන්තා මැ කරන්නී ය. ප්‍රඥා තොමෝ එසේ කොටැ ලියැ නොහෙන්නී ය. මේ කාරණය ද දැන මම, '' නුවණැත්තෝ යටත්හු ම ය. ශ්‍රීමත් ඇත්තෝ මැ උතුමැ'යි කියමි'' කී හ. නැවැත රජ්ජුරුවන් විසින්, ''කිමෙක් ද පුත, මහෞෂධ පණ්ඩිතයෙනි'' යි කී කල්හි

02. අනුරාධපුර යුගයේ ගද්‍ය සාහිත්‍යය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

03. පහත සඳහන් කෘති අතරින් එකක් පිළිබඳ ප්‍රමාණවත් විග්‍රහයක් කරන්න.

අ) අමාවතුර
ආ) බුත්සරණ
ඇ) සද්ධර්මරත්නාවලිය

නැතහොත්

පොළොන්නරු යුගය බණකතා සාහිත්‍යයේ ආරම්භක අවධිය ලෙස සැලකීම කෙතෙක් දුරට යුක්ති යුක්ත දැයි සාකච්ඡා කරන්න.

## II කොටස

04. ''සිංහල නවකතාව ප්‍රභවය වීමෙහි ලා සමකාලීන සමාජ සංස්කෘතික පසුබිම මගින් නිශ්චිත බලපෑමක් එල්ල කෙරුණි.'' මෙම මතයෙහි නිරවද්‍යතාව පරීක්ෂා කරන්න.

05. බැද්දේගම නවකතාවෙහි සාර්ථකත්වයට තුඩුදුන් සාධනීය ලක්ෂණ කවරේ දැයි සනිදර්ශන ව පහදන්න.

06. දියමන්ති මාලය කතා සංග්‍රහයෙහි ඇතුළත් කෙටිකතා දෙකක් පිළිබඳ ප්‍රමාණවත් විචාරයක් සපයන්න.

## III කොටස

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳ විග්‍රහයක් කරන්න.

අ) මහාභාරතයේ සකුන්තලා හා කාලිදාසගේ සකුන්තලා
ආ) සකුන්තලා හි සිව්වන අංකයේ වැදගත්කම
ඇ) සංස්කෘත නාට්‍ය සම්ප්‍රදාය
ඈ) භරතමුණි - රස හා භාව

08. ඇරිස්ටොෆනීස්ගේ මැඩියෝ නාට්‍යය පිළිබඳ ප්‍රමාණවත් විචාරයක් කරන්න.

09. ''රූපාත්මක කථනය අරභයා තීක්ෂණාවබෝධයකින් හෙබි අධ්‍යක්ෂවරයෙකු විසින් සාහිත්‍යයික මූලාශ්‍රය ද සමතික්‍රමණය කෙරෙන සාර්ථක සිනමා කෘති නිර්මාණය කරනු ලබයි.'' තත් ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව නිදර්ශනාශ්‍රයෙන් විභාග කරන්න.

10. කාලීන සමාජ, ආර්ථික හා දේශපාලනික යථාර්ථය පිළිබිඹු කිරීමෙහි ලා ධර්මසේන පතිරාජ සතු ශක්‍යතා පාර දිගේ තිර නාටකය ඇසුරෙන් පරීක්ෂා කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගින් පිරිනැමේ.)

****************************